Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# මුලතිව් දිස්ත්‍රික්කයේ මෑතක දී ඇති වූ සිදුවීම් පිළිබඳව හදිසි ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය යැයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉල්ලා සිටී

***2019 සැප්තැම්බර් 30, කොළඹ, ශ්‍රී ලංකාව:*** මුලතිව් දිස්ත්‍රික්කයේ නීරාවියාඩි පිල්ලෙයාර් කෝවිල සහ මුලතිව් ගුරුකන්ද පුරාණ රජමහ විහාරය අතර අයිතිය පිළිබඳ මතභේදයක් පවතිනා ඉඩමෙහි මෑත දි ඇති වූ සිදුවීම් පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කෙන්ද්‍රය දැඩි ලෙස කනස්සල්ලට පත්ව සිටී. පස්චාත් යුද ශ්‍රී ලංකාවේ ගැටුම් කාරීත්වයෙහි මතභේද ජනනය කරන්නා වූ සාධක කීපයක් මෙමගින් පැහැදිලි කොට දක්වයි. නීතියේ ආධිපත්‍ය අනතුරට පත් කිරීම, හමුදාකරණය, ඉඩම් අයිතිය පිළිබඳ ආරවුල් සිට ජාතිකත්ව-ආගමිකත්ව මතභේද දක්වාද පැතිර පවත්නා කනස්සල්ල දනවන සුළු මතභේදකාරී ගැටළු ගණනාවක් පිළිබඳව මෙම සිදුවීම සාක්ෂි සපයයි. එමෙන්ම ජාතිකවාදී බලවේග යටතේ දැඩි පීඩනයට පත්ව බෙලහීන වී ඇති සාමකාමී වතාවරණයක් ද එමගින් ඉස්මතුකොට දක්වනු ලබයි. මෙම සිදුවීම් සහ ශ්‍රී ලංකාවේ නීතියේ අධිපත්‍යයට හා සාමයට එයින් ඇති වන බලපෑම සැලැකිල්ලට ගෙන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉල්ලා සිටින්නේ උසාවි නියෝගය උල්ලංඝණය කරමින් ක්‍රියාකල සියලු දෙනා නීතිය හමුවට පැමිණ වීමට අදාළ සියලු පියවරයන් ගන්නා ලෙසය. එසේම ඊට සහයෝගය දුන් සහ ඒවා සමඟ හවුල්කාරීත්වයන් සහිතව සිටි සියලු දෙනා ද වගවීමට ලක් කර ගත යුතු වේ.

මාධ්‍ය වාර්තාවන්ට අනුව මෙම සිදුවීමට පැන නැගී ඇත්තේ නීරාවියාඩි පිල්ලෙයාර් කෝවිල සහ ගුරුකන්ද පුරාණ රජමහ විහාරය අතර අයිතිය පිළිබඳ මතභේදයන් ඇති ඉඩමක, එම රජමහවිහාරයේ වැඩවිසූ අපවත් වී වදාළ කොළඹ මේධාලංකාරකිත්ති හිමියන් ආදාහනය කිරීමට උත්සාහ කරණු ලැබ අවස්ථාවෙහිදීය. ප්‍රදේශවාසීන් සහ කෝවිල් භාරකරුවන් මෙම ක්‍රියාවට විරෝධය පලකොට ඇති අතර ඒ අනුව මෙම කරුණ අධිකරණය වෙත යොමු කරනු ලැබ මුලතිව් මහේස්ත්‍රාත් අධිකරණය මගින් එම ඉඩමෙහි ආදාහනය සිදු කිරීම වලක්වමින් සහ ඊට ආසන්න ඉඩමක ආදාහනය සිදු කිරීම අවසර දෙමින් උසාවි නියෝගයක් නිකුත්කරනු ලැබ ඇත. එසේ උසාවි නියෝගයක් තිබියදී සහ එය ඍජුව උල්ලංගණය කරමින් 2019 සැප්තැම්බර් 23 වන දින කෝවිලට අයත් යැයි කියනු ලැබ ඇති එම ඉඩමෙහි ආදාහනය සිදු විය. ගලගොඩ අත්තේ ඥානසාර හිමියන් සහ අනෙකුත් භික්ෂූන් වහන්සේලා විසින් එම ක්‍රියාවලියට නායකත්වය දෙනු ලබන ආකාරය වීඩියෝ පටයෙහි දැක්වේ. උසාවි නියෝගය උල්ලංඝණය කිරීම සහ නීතිඥවරයකුට සිදු වුයේ යැයි කියන අඩන්තේට්ටම් වැලැක්වීමට අසමත් වූ පොලීසිය හා හමුදාවද එම ක්‍රියාවන්ට නිහඬ සහයෝගයක් දැක්වූ බවද වාර්තාවන්හී දැක්වේ.

ප්‍රකෝපකාරී හැසිරීම් පිළිබඳ ඉතිහාසයක් ඇති ඥානසාර හිමියන් කීපවරක්ම විවිධ අධිකරණවල පෙනී සිටීමට ලෙස කැඳවනු ලැබ ඇත. අභියාචනාධිකරණය විසින් එම හිමියන් 2018 අගෝස්තු මස, අධිකරණයට අපහාස කිරීමේ චෝදනාව මත වරද කරු කරනු ලැබුයේ හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයේ වැඩකටයුතු වලට අවහිර කිරීම සහ අධිකරණ නිලධාරීන්ට සහ සාක්ෂිකරුවන්ට තර්ජනය කිරීම නිසාය. කෙසේ නමුත් 2019 මැයි මස දී ඔහුට ජනාධිපති සමාවක් ලබා දෙනු ලැබිණි. එම සමාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල භාවය අභියෝග කරමින් දැනට විකල්ප ප්‍රතිපත්ති කෙන්ද්‍රය අධිකරණය වෙත ගොස් ඇත. මෙම සිදුවීම හැරුණ කොට ඥානසාර හිමියන් විසින් නීතිය සම්පූර්ණයෙන්ම නොසලකා හැරි සහ අධිකරණය සහ අධිකරණ නිලධාරීන් වෙත අපහාස කළ සිද්ධීන් මාලාවක මෑත කාලීනව වාර්ථා වී ඇත. අධිකරණ නියෝගය උල්ලංඝණය කිරීම හා සම්බන්ධ ඥානසාර හිමියන් සහ

අනෙකුත් සියලු දෙනා තම ක්‍රියාව පිළිබඳව වගකීමට නතුකර ගැනීම පිණිස සියලු පියවර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව, පොලිසිය, සහ අධිකරණය සතු වගකීම අතිශය තීරණාත්මක වැදගත්කමක් උසුලයි.

වැඩිදුරටත්, වර්තමාන සිදු වීම ඇති වන්නේ හමුදාකරණය, ඉඩම් අත්පත් කර ගෙන සිටීම්, ඉඩම්වලට තරඟකාරී ලෙස උරුමකම්කීම් සහ පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශවල රජය විසින් ඕනෑකමින් ජනවාර්ගික සංයුතීන් වෙනස් කිරීම පිළිබඳ චෝදනා යනාදී මතභේදාත්මක ගැටළු ගණනාවක පසුබිමෙහිදීය. දශක දෙකකට වැඩි කාලයක් තිස්සේ, ඉඩම් ගැටළුවල ඇති සංකීර්ණත්වය සහ ගැටුම්කාරී බව මෙන්ම එමගින් සංහිඳියාව වෙත ඇතිවන බලපෑම් යනාදීය පිළිබඳව ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් අවධාරණය කොට දක්වන්නට යෙදිනි. 2015 සිට මෙම ගැටළු සීමිත දුරකට නිරාකරණය වී ඇත. එනමුත් උතුරේ හා නැගෙනහිර ඉඩම් ගැටළු නිරාකරණය කිරීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල කාර්යරාමුව සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම හා විනිවිදභාවයෙන් සහ අන්තර්ග්‍රාහීත්වයෙන් යුතු රජයේ සැලැස්මක් සකස් කර ගැනීම පිළිබඳව තවමත් දිගින් දිගටම අභියෝගයන් පවතී. අදාළ අධිකාරීන්ගෙන්, දේශපාලන නායකයන්ගෙන්, හමුදාවෙන් සහ අනෙකුත් පංගුපාර්ශවකරුවන්ගෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තම ඉල්ලීම නැවත කරමින් ඉල්ලා සිටින්නේ තවදුරටත් ප්‍රමාදකිරීමකින් තොරව මෙම ගැටළු පිළිබඳව නැවත සලකා බලන ලෙසය.

දශක ගනන් පැවැතී ඇති එපමණක් නොව ගැටුම්වලින් සහ පශ්චාත් යුද රාජ්‍ය ප්‍රතිපත්තීන් විසින් සංකීර්ණ කරනු ලැබ ඇති මෙම ප්‍රශ්ණවලට ඉක්මන් විසඳුම් නොමැත. පාස්කු ඉරිදා ප්‍රහාරයන්ගෙන් සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ජනවාර්ගික ප්‍රචනඩත්වයෙන් මෙන්ම මෙම නොවැම්බර් මාසයේදී පැවැත්වීමට නියමිතව ඇති ජනාධිපතිවරණය මගින්ද ඇති වූ අස්ථාවරත්වයන් මගින් මේවා තවත් සංකීරණ කරනු ලැබ ඇත. නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීමට සහ දන්ඩන මුක්තියේ සංස්කෘතිය අවසන් කිරීමට අදාළ අධිකාරීන් විසින් තීරණාත්මක පියවරයන් ගත යුතුව ඇත්තේ මෙවැනි උග්‍රවී ඇති දේශපාලනික, ආගමික හා ජනවාර්ගික සංවේදීත්වයන් සහිත සන්ධර්භයකදීය. මේ අවස්ථාවේදී අක්‍රීයව සිටිම මගින් සිදුවන්නේ සාහසික හැසිරීම් අනුමත කිරීමක් පමණක් නොව දණ්ඩන මුක්තියේ සංස්කෘතියද වඩාත් උග්‍ර කිරීමකි.